ශීර්ෂය 140 - කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
------------------------------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට 2018 වර්ෂය තුළ රු.1,407,6**50** ක් වටිනා ඍජු ප්‍රේෂණ බැර වී තිබුණි. එසේ වුවද, එම ලැබීම් හඳුනා ගෙන 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට හා රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කර වර්ෂයට අදාල ආදායම හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා හඳුනා නොගත් ඍජු ප්‍රේෂණ මුදල වන රු.1,407,6**50** ක මුදලින් 2019/4/30 දින වන විට රු.959,387.60 ක මුදලක් නිරවුල් වී ඇති අතර 2019.04.30 දිනට රු.448,262.03 ක මුදලක් ඉතිරි වී ඇත. එයින්, රු.285,601 ක් මුදල් පොතට ගෙන ඇත. ඉතිරි රු.137,661.03 ක් මුදල් පොතට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ රු.1,800,206,000 ක් දැක්වීම වෙනුවට වෙනත් මූලාශ්‍ර වලින් ලද රු.39,611,825 ක් ද ඇතුළත්ව රු.1,839,817,825 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. 2019 මූල්‍ය කාර්ය සාධක ප්‍රකාශනය පිළියෙල කිරීමේදී පෙන්වා දී ඇති කරුණු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.240,865,352 ක් දේපළ, පිරියත හා උපකරණ ශේෂය ලෙස දැක්විය යුතු වුවත්, එය රු.5,455,801 ක් අඩුවෙන් රු.235,409,551 ක් වශයෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනයේ ඒ.සී.ඒ.6 ආකෘතියට අනුව 2018.12.31 දිනට ශේෂය ලෙස දක්වා ඇති රු.235,409,551 ක මුදල නිවැරදි බව ප්‍රකාශ කරමි.<br>2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 1,417,524,872 කින් වැඩියෙන් ද ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 1,417,514,872 ක් අඩුවෙන් ද දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 10,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රථම වරට 2018 වර්ෂයේදී හඳුන්වා දී ඇති අතර හරස් සටහන් ලැබීම හා ගෙවීම්ද ගලපා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අඩුපාඩු සිදු වී ඇති බව පිළිගනිමි. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම අඩුපාඩු හැකිතාක් දුරට අවම කර ගැනීමට කටයුතු කරමි. |

1.6.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුමේ මාසික ගිණුම් සාරාංශ අනුව හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ගිණුම්වල හර ශේෂ අතර වෙනස රු.198,884 ක් ද , බැර ශේෂ අතර වෙනස රු.3,788,379 ක් වශයෙන් ගැලපුම් ගිණුමේ දැක්විය යුතුයි. එසේ වුවද, ගැලපුම් ගිණුමේ දක්වා ඇත්තේ හර ශේෂය රු.2,475,360 ක් හා බැර ශේෂය රු.6,258,235 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 විධිවිධාන අනුව ගිණුම් තබා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. අත්තිකාරම් ගිණුමේ 11 , 12 හර හා බැර ශේෂයන් එහි මුළු එකතුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සැලකිල්ලට ගෙන ගැලපුම් ගිණුම පිළියෙල කර ඇති නිසා මෙම වෙනස සිදු වී ඇත. 2019 වර්ෂයේ මෙවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර සටහන් හා ඉදිරිපත් කර ඇති ගිණුමෙහි පොත් අනුව ශේෂය අතර රු.6,042 ක වෙනසක් පැවති අතර එම වෙනසට හේතුන් 2019 මැයි 10 දින දක්වාම හඳුනාගෙන නොතිබුණි. | ලේඛන, පොත් පත් නිවැරදිව පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති වෙනස පිළිගනිමි. 2018 වර්ෂයට පෙර වර්ෂ වල සිට ඉදිරියට එන මෙම වෙනස 2019 වර්ෂයේ ගිණුම සකස් කරන විට හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දින වන විට සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.326,582 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4.5 වගන්තියේ උපදෙස්වලට අනුව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | සිදු වී ඇති අඩුපාඩුව පිළි ගනිමි. |
| (ඈ) | අංක 14001 යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුමේ වියදමේ උපරිම සීමාව රු. 655 ක් ඉක්මවා තිබුණු බව නිරීක්‍ෂණය විය | වාර්ෂික විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 14001 යටතේ වියදමේ උපරිම සීමාව නොඉක්මවා වියදම් දැරිය යුතු වීම. | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. 2018 වර්ෂය සඳහා රු. මිලියන 15 ක් සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර රු. 16,675,655.00 වියදම් කිරීම නිසා වැඩිපුර වැය වූ මුදල් සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. |

**1.6.5** තැන්පතු

----------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු තැන්පතු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ලේඛනයට අනුව ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂය අතර වෙනස රු.329,397 ක් විය. | අමාත්‍යාංශයේ පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීමට කටයුතු කළ යුතු වීම. | විගණන වාර්තාවේ පෙන්වාදී ඇති රු.329,397 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.6.6 **දේපල පිරියත හා උපකරණ**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.6,761,702 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එය රු.1,305,901 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් මිලදී ගැනීම් රු.5,455,801 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ලේඛන නිවැරදිව පවත්වා ගෙන යෑමට කටයුතු කළ යුතු වීම. | වර්ෂයේ මිලදී ගැනීම් ලෙස දක්වා ඇති රු.1,305,901 ලෙස ඇතුළත් වුවද, ඇතුළත් කළ යුතු වන්නේ රු.6,761,702 බව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මාසික ගිණුම් සාරාංශ අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම රු.6,806,702 ක් දක්වා තිබුණි. එසේ වුවද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකම රු.11,980,714 ක් වීමෙන් වෙනස රු.5,219,012 ක් විය. | අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ලේඛණ නිවැරදිව පවත්වා ගෙන යෑමට කටයුතු කළ යුතු වීම. | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි වැය ලෙජරයේ අඩුවෙන් සටහන් වීම් හා වැඩියෙන් සටහන් වීම් ඇති බව පිළිගනිමි. 2018 වර්ෂයේ නව පත්වීම් ලබා පැමිණි නිළධාරීන් වැඩි පිරිසක් ගිණුම් අංශයේ සේවය කරන බැවින් පොත් පත් වල සටහන් කිරීමේ දෝෂ සිදු වී ඇත. ඉදිරියේදී මෙම අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. |

1.6.7 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

**පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ---------- | ---------------------------------------- |
| (අ) | <u>ණය පොලී අය කරගැනීම</u> | | |
| | අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කර ඇති මඟ පෙන්වීම අනුව නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන ණය මුදල් සඳහා සියයට හතරක පොළියක් අයකරන බව දක්වා ඇති නමුත් එම ආදායම අයකර ගැනීම සම්බන්ධ තොරතුරු හෝ වර්ෂය තුල ලැබූ ණය පොලී ආදායම හෝ ලැබිය යුතු ණය පොලී ආදායම හඳුනාගත හැකි පරිදි පොත් පත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව පොත් පත් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය | මේ වන විට ණය අයකිරීම් විධිමත් ලෙස වෙන වෙනම ගොනු හා මාසිකව යාවත්කාලීන කරනු ලබන ණය අයකිරීම් වාර්තාද පවත්වා ගනු ලබන බව කාරුණිකව දන්වමි. එසේම මෙහි දක්වා එම වාර්තා ණය පොලී ආදායම හඳුනා ගතහැකි පරිදි පවත්වා ගැනීමට සටහන් කර ගතිමි. |
| (ආ) | <u>ඇප ලේඛනය</u><br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ඇප ලේඛනයක් සකස් කර යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| (ඇ) | <u>බැරකම් පිළිබඳ ලේඛනය</u><br>බැරකම් පිළිබඳ ලේඛනය මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළ යුතු වීම. | ලබා දී ඇති උපදෙස් පරිදි බැරකම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | <u>චක්‍රීය අරමුදල සඳහා පොත්පත් පවත්වා ගැනීම</u><br>මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) අනුව මහජනයාට දෙන ණය මුදල්, හිමිකම්පෑම් වෙනුවෙන් කෙරෙන කොටස් ගෙවීම් ගිණුම්ගත කිරීම හා මුල් ගෙවීම සඳහා අධිකාර බලය දීමේදී නියම කරන ලද කොන්දේසි ප්‍රකාරව සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා පොත්පත් පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාශ පොත් පත් පවත්වා ණය මුදල් අයකර ගැනීමට යුතුව කටයුතු කළ යුතුය. | ණය අයවීම් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයේ නොමැති බවත්, ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. |

**1.6.8 විගණන සාක්ෂි නොවීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ---------- | ------------------------------------ |
| (අ) | ගොඩනැගිලි කුලී, සේවා සැපයීම් හා ඉදිකිරීම් ව්‍යාපෘතිවල බැඳීම් පරීක්ෂා කිරීම සඳහා එකඟ වී ඇති ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මුදල් රෙගුලාසි 702(3) අනුව කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්වලට එළඹිය යුතු බව. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | රජයේ ආදායමට අඩුවෙන් බැර කිරීම 2017 වර්ෂයේදී හා 2018 වර්ෂයේදී පිළිවෙලින් රු.12,531,657 හා රු.1,618,836 ක් වශයෙන් එකතුව රු.14,150,493 ක් විය. ඒ සම්බන්ධයෙන් හේතු සහ පැහැදිළි කිරීම් ඉදිරිපත් නොවුණි. එසේ වුවද, සංවර්ධන අංශයේ අතිරේක ලේකම්ගේ ලිපි අනුව විස්තර පහත දැක්වේ.<br><br>**(i)** 2018 වර්ෂයේදී වතු නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන්ගෙන් නිවාස ණය අයකර රු.19,991,707 ක් රජයේ ආදායමට බැර කර ඇතත්, 2018 වර්ෂයේ ණය නැවත අය කිරීම රු.21,610,543 බව දක්වා තිබුණි. එම හේතුවෙන් 2018 වර්ෂයේදී ණය නැවත අය කිරීම් රු.1,618,836 ක් අඩුවෙන් රජයේ ආදායමට බැර කර තිබුණි.<br><br>**(ii)** 2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට ණය නැවත අයකිරීම රු.13,045,536 ක් හා වැවිලි සංවර්ධන භාරය විසින් එකතු කර | එකතු කරන සියලුම ණය හා පොලිය රජයේ ආදායමට බැර කළයුතුය. ඒ ඒ කාලපරිච්ඡේද වලට අය විය යුතු ණය වාරික හා පොලියද ගණනය කර හිඟ මුදල් අයකර ගැනීමටත්, නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුවේ. | මේ වන විට සංවර්ධන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තා අනුව, 2017 වර්ෂය තුළ අය කර ගනු ලැබූ මුලු ණය අයකිරීම් ප්‍රමාණය රු.9,270,607.11 වන අතර 2018 වර්ෂය තුළ ණය අයකිරීම් ප්‍රමාණය රු. 21,610,542.98 කි. |

ඇති ණය නැවත ගෙවා නොමැති මුදල් වෙනුවෙන් හිලවු කරගත් ඔවුන් වෙත ගෙවිය යුතු කළමනාකරණ ගාස්තු රු. 17,106,132 ක් බවද දක්වා තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට රජයේ ආදායමට බැර කළ යුතු මුළු ශේෂය රු.30,151,668 ක් වුවද, රජයේ ආදායමට බැර කර තිබුණේ රු.17,620,011 ක් පමණි.

**1.6.9 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්.**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පෙන්වා දී ඇති කරුණු අනුව නිළධාරීන් දැනුවත් කර ඉදිරියේදී කටයුතු කිරීම සඳහා සටහන් කර ගතිමි. |

**1.6.10 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i) මුදල් රෙගුලාසි 104(4)** | ප්‍රාරම්භක පරීක්ෂණයෙන් පසු අලාභ හානි සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාව | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ ඉදිරිපත් නොකළ අවස්ථා 4ක් නිරීක්ෂණය විය. | | |
| **(ii) මුදල් රෙගුලාසි 570 සහ 571(1), (3)** | තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉකුත්වූ තැන්පතු අවස්ථා 35 ක එකතු වටිනාකම රු.9,008,068 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | මු.රෙ.570, 571(1) හා 571(3) ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳව මු.රෙ. 570 ප්‍රකාරව 2019 වර්ෂයේ සිට මාස 6කට වරක් ලැයිස්තුවක් පිළියෙළ කර විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති වසර දෙක ඉකුත් වූ රු.9,008,068. සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරමි. |

**1.6.11 අධිකාර බලය නොලත් ගණුදෙනු**

**---------------------------------------**

**පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.**

| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **නිර්දේශය**<br>---------- | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>---------------------------------------- |
|---|---|---|---|
| **(අ)** | 2018 වර්ෂයට පෙර ආරම්භ කර නිම නොකරන ලද නිවාස ව්‍යාපෘති හා 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක හරිත රන් නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් වැවිලි මානව සංවර්ධන භාරය මඟින් ක්‍රියාත්මක කර අධීක්ෂණය කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 6 ක් ගෙවීමට ව්‍යාපෘති ඉදිකිරීම් මගපෙන්වීම් සංග්‍රහයෙන් එකඟවී තිබුණි. ඒ අනුව 2018 වර්ෂය තුළ සියයට 6 ක කළමණාකරණ ගාස්තුව රු.45,781,306 ක් ගෙවා තිබුණි. එසේ වුවද, නිවාසවල වටිනාකම සඳහා 2015 හා 2017 වර්ෂවල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමේදී හෝ මෙම කළමනාකරණ ගාස්තු ගෙවීම සඳහා අනුමැතියක් ලබාදී ඇති බවට විගණනයේදී තහවුරු නොවුණි. | නිසි අනුමැතියක් ලබා ගත යුතු අතර හා නීතියානුකූලව වගකීම පැවරීමට ගිවිසුමකට එළඹිය යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | වැවිලි මානව සංවර්ධන භාරයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය වෙනුවෙන් ණය එකතු කර අමාත්‍යාංශයට ගෙවිය යුතුව පැවති ශේෂය රු.මිලියන 33.2 ක් විය. ඊට | රජයේ මුදල් බාහිර පාර්ශවයන් තුල තබා ගැනීමට ඉඩ ලබා නොදී නියමිත දිනට බැර කිරීමට හැකි වන | ණය අයකිරීම සෘජුවම වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබා දී තිබූ අතර එම මුදල් අමාත්‍යාශය වෙත නැවත එවීමක් සිදු වී නොමැත. ණය අයකිරීම් සෘජුවම අමාත්‍යාංශය වෙත |

| | | |
|---|---|---|
| අමතරව 2018 වර්ෂය තුළදී රු. මිලියන 4.9 ක් එකතුකර තිබුණද සමාලෝචිත වර්ෂයේදී භාරය විසින් අමාත්‍යාංශයට ගෙවා තිබුනේ රු. මිලියන 7.2 පමණි. ඒ අනුව භාරය විසින් අයකරගෙන ඇතත්, 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට ප්‍රේෂණය නොකළ මුදල රු. මිලියන 31 විය. | පරිදි අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු වීම. | එවන මෙන් වතු කළමනාකාරිත්වයට දැනුම් දී ඇත. මේ වන විට වැවිලි මානව සංවර්ධන භාරය තුල රඳවා තබා ඇති මුදලට අදාල නිශ්චිත තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දී නොමැති අතර 2018 අගෝස්තු 28 දිනට රු.7,994,450.83ක මුදලක් වැවිලි මානව සංවර්ධන භාරය මඟින් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. එසේම අමාත්‍යාංශය වෙත අයවිය යුතු කළමණාකරන ගාස්තු වලින් රු.17,106,132.36 ක මුදලක් ද ණය අයකිරීම් ලෙස වැවිලි මානව සංවර්ධන භාරය වෙතින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**2 මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 15 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 29.08 ක ඉතිරියක් නිරීක්ෂණය වූ අතර එය වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 55 ක් දක්වා අතර පරාසයක් ගෙන තිබුණි. තවද, පුනරාවර්තන වැය විෂයයක් සඳහා වෙන්කළ රු. 50,000 ක ප්‍රතිපාදනය සියයට 100 ක ඉතිරියක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ පරිදි අග්‍රිම ඒ ආකාරයෙන්ම නොලැබුණි. එම නිසා සැලසුම් කළ පරිදි පුනරාවර්තන වියදම් වැය කිරීමට නොහැකි විය. තවද, රටේ පැවති දේශපාලනික වෙනස් වීම් නිසා අමාත්‍ය කාර්ය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම් සිදු නොකිරීමද, ප්‍රතිපාදන ඉතිරියට බලපා ඇත. |
| (ආ) | මූලධන වැය විෂයන් 10 ක් සඳහා වෙන්කළ රු.මිලියන 2,719.**35** ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,665.**32** ක් වැය කර සියයට 8 ක සිට සියයට 90 ක් දක්වා වූ පරාසයක් තුළ රු**.** මිලියන.1,054**.03** ක ඉතිරියක් නිරීක්ෂණය විය. | -එම- | විගණන නිරීක්ෂණ පිළිගනිමි මිලදී ගැනීම සඳහා ඇණවුම් ද යවා තිබුණි. 2018 දෙසැම්බර් මාසයේදී අපේක්ෂිත පරිදි මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබා නොදීම නිසා මිලදී ගැනීම් සිදු කළ නොහැකි වූ අතර මේ |

හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය.

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ---------- | ----------------------------------- |
| (අ) | අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ඉක්මවා සැපයීම් හා සේවාවලට අදාළ නොවන වැය විෂයන් 2 ක් යටතේ රු.595,688 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැරකම් නිසි පරිදි හඳුනාගත යුතු වීම. | වැය විෂයය 140-1-2-1301 යටතේ රු.497,345.00ක මුදලක් බැරකම්වලට එළඹ නොමැති අතර 140-1-1-1301 යටතේ බැරකම්වලට එළඹ ඇත්තේ රු. 31,561.00 මුදලක් සඳහා පමණි. |
| (ආ) | 2019 වර්ෂයේදී පෙබරවාරි මාසය දක්වා ගෙවීම් කරන ලද වවුචර් අතරින්, සැපයීම් හා සේවාවලට අදාළ නොවන වැය විෂයන් 4ක් සඳහා හා අදාල වන වැය විෂයයන් 6ක් සඳහා ලේඛන ගත නොකරන ලද මුළු බැරකම් වටිනාකම රු. 1,631,881 විය. | 2017 අප්‍රේල් 17 දිනැති අංක **255/2017** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව බැරකම් ලෙස ලේඛනගත කළ යුතු වීම. | (ආ)**,**(ඇ). විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි බැරකම් ලෙස ලේඛන ගත කර නොමැති බව පිළිගනිමි. 2018.12.31 දිනට පෙර අදාළ අංශ විසින් ගිණුම් අංශය වෙත මෙම බැරකම් පිළිබඳව වාර්තා නොකිරීම නිසා මෙම අඩුපාඩු සිදු වී ඇත. |
| (ඇ) | 2017 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව නිවාස ව්‍යාපෘති සඳහා කලාප 4කට අදාලව 2018 ජනවාරි 01 දිනට පැවති බැදීම් රු.මිලියන 932.11 කින් 2018 වර්ෂය තුළදී ගෙවීම්කර ඇත්තේ රු.මිලියන 305 ක් පමණි. ඊට අමතරව කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම නොකරන නිවාස 561 ක් සඳහා රු. මිලියන 1,367 ක් හා 2017 වර්ෂයට අදාළව රු.මිලියන 627.11 ක් වශයෙන් රු.මිලියන 1,994.48 ක බැදීම් නිරීක්‍ෂණය විය. එසේ වුවද, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැදීම් කිසිවක් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ට අනුව බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු වේ. | 2018 ජනවාරි 01 දිනට නිවාස ව්‍යාපෘති සඳහා ගාල්ල**,**බදුල්ල**,** කෑගල්ල හා නුවර එළිය යන කලාප සඳහා රු. මිලියන 932.11ක බැදීම් තිබුණි.(ඇමුණුම **-i)** එසේම සංවර්ධන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන ප්‍රගති වාර්තා වල එක් එක් ව්‍යාපෘතියේ මුලු බැදීම් වටිනාකම් පැහැදිලිව දක්වා ඇත. |

2.3 **බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 සැප්තැම්බර් 27 දිනැති ණය අයකර ගැනීම් සඳහා හොරණ වැවිලි සමාගමින් ඉදිරිපත් කරන ලද රු. 126,260 ක් වටිනා චෙක්පත් දෙකක් අමාත්‍යාංශයේ නම වැරදියට සටහන් කිරීම හේතුවෙන් මුදල් කරගත නොහැකිවී ඇති අතර එම චෙක්පත් නැවත ගෙන්වා ගැනීමට 2019 අගෝස්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | නිසි අභ්‍යන්තර පාලනයක් හා අධීක්ෂණයකින් මුදල් ගණුදෙනු සිදුකළ යුතු වීම. | මෙම චෙක්පත් දෙකෙහි අමාත්‍යාංශයේ නම වෙනස් වීම නිසා හරවා යවා ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරන ලද බැංකු සැසඳුමට අනුව හඳුනා නොගත් ලැබීම් ලෙස මාස 01 ක සිට මාස 13 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන ශේෂය රු.1,407,650 ක් විය. එම ශේෂය තුළ නිවාස ණය නැවත අය කර ගැනීම් සමාගම්වලින් සෘජුවම අමාත්‍යාංශයේ ජංගම ගිණුමට තැන්පත් කර ඇති රු.526,060 ක මුදලක් ඇති අතර එය හඳුනාගෙන රජයේ ආදායමට ගෙන නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙළ කර, ලද ආදායම් නිසි පරිදි හඳුනා ගෙන පොත්වලට හා ගිණුම් වලට ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | 2018 වර්ෂයට අනුමත ක්‍රියාකාරී සැලැස්ම තුල 2014 පෙබරවාරි 14 දිනැති අංක 2014/01 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 03 ජේදයේ දක්වා ඇති පහත තොරතුරු අන්තර්ගත නොවූ බව නිරීක්ෂණය විය.<br><br> සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කර තිබුණු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය අනුමත | චක්‍රලේඛයේ උපදෙස් අනුව සියලු තොරතුරු ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | ඡේද සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු හා එකඟ වෙමි. විගණන උපදෙස් පරිදි 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඊට අනුව සකස් කිරීමට කටයුතු කර ඇත. |

කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය

□ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව (**Time Line**) එක් එක් ව්‍යාපෘතිය වශයෙන් හඳුනා ගත හැකි පරිදි දක්වා නොමැත.

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂය සඳහා පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව අනුව එක් එක් ප්‍රදේශ හා වතු වශයෙන් වෙන් කර තොරතුරු ලබාගත හැකි පරිදි පිළියෙල නොකිරීම නිසා නිවාස ව්‍යාපෘතිවල 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය තුළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය නිවැරදිව ඇගයීමට නොහැකි විය. | සියලුම අංශ නියෝජනය වන පරිදි චක්‍රලේඛ උපදෙස් වලට අනුව ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව නිවරදිව සහ භෞතිකව පරීක්‍ෂා කළ හැකි පරිදි සකස් කළ යුතු වීම. | ඡේද සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු හා එකඟ වෙමි. විගණන උපදෙස් පරිදි 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඊට අනුව සකස් කිරීමට කටයුතු කර ඇත.<br>2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මඟින් එක් එක් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික ඉලක්කයන් හා එකී එක් එක් ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය දක්වා ඇත.<br><br>එක් ව්‍යාපෘතියක් සඳහා නිශ්චිත පොදු ව්‍යාපෘති කාල සීමාවක් දැක්විය හැකි වුවද ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වන ආකාරයට අනුව ක්‍රියාකාරී සැලැස්මට හා කාර්යසාධන වාර්තාවට එසේ එක් එක් ව්‍යාපෘති වශයෙන් සියලු ව්‍යාපෘති ඇතුළත් කිරීමට ප්‍රායෝගිකව හැකියාවක් නොමැත. |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 වර්ෂය තුල නිවාස ව්‍යාපෘතියේ අධියරයන් 2ක් යටතේ නිම කිරීමට සැළසුම් කර තිබුණු රු.219,000,000 ක් වටිනා නිවාස 219 ක් වර්ෂය තුලදී ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි නිවාස ඉදිකිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය තුල ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොලැබීමත්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හී පවතින අධික වැසි සහිත කාලගුණික ස්භාවයත්, සුදුසු ඉඩම් තෝරා ගැනීමට අදාළ NBRO වාර්තා ලබා ගැනීමේදී ඇතිවූ ප්‍රමාදයත් අපේක්ෂා කළ පරිදි |

| | | |
|---|---|---|
| | | ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි විය. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි මස ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.27,000,000 ක් වූ වර්ෂ අවසානයේ වියදම රු.5,590,000 ක් වූ මිල්ලවිටිය, අළුපොළ, වෙල්ලවල හා වුලුඩන් පන්ටිය යන ව්‍යාපෘති 04 ක් නිම නොකර අත්හැර දමා ඇති බවට අනාවරණය විය. | ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යනයක් කර, ඉදිකිරීම් කිරීමට සුදුසු ඉඩම් හඳුනා ගැනීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. අත්හැර දැමූ ව්‍යාපෘති පිළිබඳව පරීක්ෂා කර දැරූ වියදමේ අපතය අවම කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය තුළ ව්‍යාපෘති නිම නොකර අත් හැර දමා නොමැති බව කාරුණිකව දන්වමි. |

### 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය තුළදී ව්‍යාපෘති අවස්ථා 83 ක් යටතේ නිමකිරීමට රු.1,996,375,141 ක් ඇස්තමේන්තු සකස් කර තිබුණි. ඉන් ව්‍යාපෘති 32 ක නිවාස 488 ක ඉදිකිරීම් නියැදියකින් ඉදිකිරීම් නිම කර තිබුණේ නිවාස 189 ක් පමණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කළ යුතු වීම. | 2018 වර්ෂයෙහි හරිතරන් නිවාස ව්‍යාපෘතිය 2018 මැද භාගයවන විට අනුමත කර වැවිලි මානව සංවර්ධන භාරය වෙත දැන්වීමට කටයුතු කළද එම නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් අදාල වතු සමාගම් මඟින් නිදහස් කර ගැනීම සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වීමද **NBRO** වාර්තා ලබා ගැනිමේදි සිදු වූ ප්‍රමාදයන්ද හේතුවෙන් හා 2018 වර්ෂය තුල අපේක්ෂිත පරිදි භාණ්ඩාගාරය මඟින් අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් නොකිරීම හේතුවෙන් එම නිවාස ව්‍යාපෘති අපේක්ෂිත කාල සීමාව තුල ඉටු කළ නොහැකි විය. |
| (ආ) | 2018 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව වර්ෂය ආරම්භයේදී අවිච්ඡේද නිවාස 3345ක් තිබූ අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිමකර ඇති නිවාස සංඛ්‍යාව 1458 ක් පමණක් විය. | - එම- | |

## 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, 2017 හා 2018 වර්ෂවල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තා හා විගණනයට වතු වශයෙන් ඉදිරිපත්කළ විස්තරාත්මක ප්‍රගති වාර්තා අතර පහත පරිදි පවතින නොගැලපීම් හේතුවෙන් එම වාර්තාවල නිවැරදි භාවය පිළිබඳ විගණනයේදී සැහීමකට පත්විය නොහැකි විය.<br>**i** 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ හරිත රන් නිවාස යෝජනා ක්‍රමයේ අදියර දෙක යටතේ නිවාස 1500ක් ඉදිකිරීමට යෝජනා වී ඇති අතර, කාර්යසාධන වාර්තාවෙහි එම යෝජිත නිවාස ප්‍රමාණය 1566ක් ලෙස හා ප්‍රගති වාර්තාවේ නිවාස ප්‍රමාණය 1136 ක් වශයෙන් දක්වා තිබුණි.<br>**ii** 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තා අනුව 2017 දෙසැම්බර් 31 දිනට අවිච්ඡේද නිවාස සංඛ්‍යාව 2543ක් වූවද, 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තා අනුව 2018 ජනවාරි 01 දිනට අවිච්ඡේද නිවාස සංඛ්‍යාව 2567 ක් විය. නමුත් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ වර්ෂයේ ආරම්භක දින අවිච්ඡේදව පැවති නිවාස 3325ක් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර ප්‍රගති වාර්තා අනුව 2018 ජනවාරි 01 දිනට අවිච්ඡේද නිවාස සංඛ්‍යාව 3345ක් ලෙස දක්වා තිබුණි.<br>**iii** 2018 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව නිම කළ නිවාස සංඛ්‍යාව 1458 ක් වූ නමුත් කාර්යසාධන වාර්තාව අනුව නිම කළ නිවාස සංඛ්‍යාව 936 ක් විය.<br>**iv** ප්‍රගති වාර්තාවෙහි හරිත රන් නිවාස පළමු අදියරහි මුළු නිවාස සංඛ්‍යාව 571ක් ලෙස දක්වා තිබුනද එහි සත්‍ය එකතුව 323ක් විය. | නිවැරදි තොරතුරු අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට අංශ අතර තොරතුරු කාලීනව හුවමාරු කර ගැනීමටත් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වීම. | කාර්යසාධන වාර්තාව සඳහා නිවාස ණය අය කිරීම පිළිබඳව තොරතුරු සංවර්ධන අංශය මඟින් ලබා දී ඇත. එසේ නමුත් මෙම වෙනස සම්බන්ධයෙන් සංවර්ධන අංශය වෙතින් විමසා බලා නිවැරැදි තොරතුරු අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව සංශෝධනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම, හා කාර්යසාධන වාර්තාව පිළියෙල | චක්‍රලේඛ උපදෙස්වලට අනුව ක්‍රියාකාරී සැලැස්ම අදාල | 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි අදාළ ක්‍රියාකාරකම් |

| | | |
|---|---|---|
| කිරීමේදී පහත අඩුපාඩු තිබීම නිසා එක් එක් නිවාස ව්‍යාපෘති සඳහා 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා භෞතික හා මූල්‍ය කාර්යසාධනය වෙන් වෙන්ව පරීක්ෂා කළ නොහැකි විය. | කාර්යය සාධකයන් සමඟ භෞතිකව පරීක්ෂා කළ හැකි පරිදි ඉලක්කයන් ඇතුලත් කරමින් සකස් කළ යුතු වීම. | සඳහා ඉලක්ක ගත නිමැවුම් ඇතුළත් කර ඇත. |
| **i** එක් එක් ප්‍රදේශ හා වතු වශයෙන් වෙන් කර තොරතුරු ලබාගත හැකි පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල නොකිරීම. | | |
| **ii** ව්‍යාපෘති සඳහා වූ කාර්යයසාධන /ප්‍රගති වාර්තාවෙහි ව්‍යාපෘති ආරම්භක හා අවසාන දිනයන් දක්වා නොමැති වීමෙන් නිවසක් ඉදිකිරීම සඳහා වූ මාස 8 ක සැලසුම් කළ කාලය ඉක්මවූ ව්‍යාපෘති ප්‍රමාදය හඳුනාගැනීමට නොහැකි විය. | | |

**3.6 විදේශ ආධාර ව්‍යාපෘති**

-----------------------------

පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ---------- | ------------------------------------ |
| ඉන්දියානු රජයේ ආධාර යටතේ හැටන් වෘත්තිය පුහුණු ආයතනයේ වැඩි දියුණු කිරීමට රු.මිලියන 94ක විදේශාධාර හා රජය මගින් රු.මිලියන 15 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2018 වර්ෂය තුළ විදේශාධාර වැය කර නොතිබුණු අතර රජයේ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.43 ක් පමණක් වැය කර තිබුණි. | රජයේ හා විදේශීය ආධාරවලින් උපරිම ඵලදායීතාවයක් ලැබෙනසේ වැඩ කටයුතු කිරීමට ප්‍රමාණවත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතු විය. | භූමියේ මැණුම් කටයුතු හා පාංශු පරික්ෂණයේදී අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් වැය කිරීමට සිදුවිය. තවද, පුහුණු උපකරණ මිලදී ගැනීමේ කටයුතුද ගොඩනැගිල්ලේ ටෙන්ඩර් කටයුතුද සමඟ ඒකාබද්දව සිදු කිරීමට සැලසුම් කළ බැවින් අපේක්ෂිත කාර්යයන් සඳහා මුදල් වැය කිරීමට නොහැකි විය. |

**3.7 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

---------------------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ---------- | ------------------------------------ |

| | | | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 03 ක් සඳහා ලබාදුන් රු.මිලියන 2,600 ප්‍රතිපාදන වලින් රු.මිලියන 1,588.31ක් වැය කිරීම හේතුවෙන් රු.මිලියන 1,011.69 ක් හෙවත් සියයට 38.91 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | සුදුසු ඉඩම් තේරීමේදි හා එම ඉඩම් නිදහස් කර ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් හා 2018 වර්ෂය තුළ ප්‍රතිපාදන නිසි පරිදි නොලැබීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා වෙන් වූ මුදල සම්පූර්ණයෙන් වියදම් කිරීමට නොහැකි විය. |
| (ආ) | කොටියගල නිවාස ව්‍යාපෘතිය.<br>---------------------------------- | | |
| (i) | නිවාස 184 ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩරය ප්‍රධානය කිරීමේ දී කොන්ත්‍රාත්කරුගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව හා හතරවන අවම මිල ඇගයීමටද නොගෙන විනිවිදභාවයෙන් තොරව පස්වන අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. තවද, 2016 මැයි 23 දින කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුමේ ආරම්භ හා අවසන් දිනයන්, ප්‍රමාද ගාස්තු සම්බන්ධ කොන්දේසි කිසිවක් හා ගිවිසුමේ වටිනකම ද සඳහන් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. | කොටියාගල නිවාස ව්‍යාපෘතිය නිවාස 184 ක් ඉදිකිරීම සඳහා ඊස්ට් ලංකා ආයතනයට භාර දෙන ලදී.එහිදී ආයතන 14ක් මිල ගණන් ඉදිරිපත් කළ අතර අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද පලවන හා දෙවන ආයතන වලින් පසුගිය ඉදිකිරීම් පිළිබඳ විස්තර සැපයීමට නොහැකි වූ නිසා හා දෙවන මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයට හුප්ටවැලි නිවාස 150ක් ලබා දීම නිසා මෙම නිවාස ව්‍යාපෘතිය පැවරිමට නොහැකි විය.තුන්වන අවම මිල ගණන් වන මෙම කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ගණනට එනම් ඔවුන් දැක්වූ මිල ගණනට රු.21000ක් අඩුවෙන් (රු.638,830)කට නිවසක් ඉදිකිරීමට එකඟ වූ නිසා එය ඔවුන්ට පවරණ ලදී. |
| (ii) | කොන්ත්‍රත්තුව ප්‍රදානය කළ 2016 මැයි 23 දිනෙන්ද පසුව එනම් 2016 ජුනි 08 ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමණාකරන අංශය මගින් අදාල වාර්තාව ලබාගෙන තිබුණි. එම නිර්දේශයන් පිළිබඳව සැලකිලිමත්ව ව්‍යාපෘති සැලසුම් හා පිලිවිතර සකස් නොකිරීමත් ඒවා අනුගමනය නොකිරීමත් හේතුවෙන් නිම කළ නිවාස 42 ක නිවාස ලාභීන් භාර ගෙන තිබුණි. | ව්‍යාපෘතියට ආදාල භූමිය තෝරා ගෙන ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව අනුව සුදුසු පරිදි නිවාස සංඛ්‍යාව තෝරා ගැනීමටත්, කොන්ත්‍රාත් නිසි පරිදි අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතු වීම. | මෙම ඉදිකිරීම් භාරගත් කොන්ත්‍රාත්තරු (Tender කැඳවීමකින් තෝරා ගත්) ප්‍රවාහණ හා අනෙකුත් වියදම් අධික නිසාත් ඉතා දුෂ්කර ස්ථානයක පවතින නිසාත් ඉදිකිරීම් ප්‍රමාද කරන ලදී. කෙසේ නමුත් නිවාස නිම කර ගැනීමට අවශ්‍ය වූ නිසා ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට තීරණය ගැනිනි. |

| | | |
|---|---|---|
| (iii) කොටියාගල වතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් නිවාස 184 කින් 42ක් පමණක් නිම කර ඇති බව හා ඉතිරි නිවාස ඉදිකිරීම කොන්ත්‍රාත්කරු 2017 ජූනි මාසයෙන් පසුව නතර කර ඇති බවත් දන්වා තිබුණි. ඒ වෙනුවෙන් ගෙවීමට හැකි උපරිම මුදල රු.26,830,910 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති මුදල රු.31,964,677 ක් විය . ඒ අනුව රු.5,133,766 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතු වීම. | මෙම ස්ථානයේ නිවාස 184ක් සැලසුම් කළ නමුත් ස්ථානයේ ඇති පාරිසරික ගැටලුකාරී තත්ත්වය නිසා නිවාස 42ක් පමණක් නිම කිරීමට සිදු විය. සිදු වූන අධික වියදම් හේතුවෙන් ඔහු වැඩ බිම අතහැර යන ලදී. මේ පිළබඳ අවස්ථා ගණනාවකදී දැනුම් දුන් අතර ඔහුට විරුද්ධව කටයුතු කිරීමට ඉක්වාඩ් ආයතනය දැනුවත් කර පියවර ගැනීමට කටයුතු කෙරිණි. මෙම ආයතනය කළ අතිරේක වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කර නොමැත. එම නිසා මෙහි දක්වා ඇති මුදල් වැඩිපුර ගෙවූ මුදලක් ලෙස සටහන්ව ඇත. |
| | | එම - |
| (iv) ඉහත දැක්වෙන නිවාස 42 කේ ප්‍රතිලාභීන් විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට 2018 සැප්තැම්බර් 10 දින වෙනත් ආයතනයක් වන බැරුන්ඩිනා ආයතනය සමග 2018 නොවැම්බර් 15 දිනට ප්‍රථම වැඩ නිම කිරීමට විනිවිධභාවයෙන් හා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයෙන් තොරව රු.මිලියන 7 ක ගිවිසුමකට එකඟ වී රු.මිලියන 1.36 ක් ගෙවා තිබුණි. අනුමත ප්‍රතිපාදන ඉක්මවා සිදුවන මෙම වැය කිරීම් ද ඉහත මුදලට අමතරව රජයට අලාභයක් වී ඇත. | -එම - | |
| (ඇ) ග්‍රීන් ගෝල්ඩ් නිවාස ව්‍යාපෘතිය යටතේ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද නිවාස භෞතික පරීක්ෂාවේදී එම නිවාස ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව හා පදිංචියට නුසුදුසු තත්ත්වයෙන් ඉදිකිරීම් වන බව පහත කරුණු අනුව තහවුරු විය.<br><br>(i) නිවාසවල ගෙබිම කොන්ක්‍රීට් දැමීමට පෙර පස් නියමිත පරිදි තලා නොතිබීම හා කොන්ක්‍රීට් මිශ්‍රණයට පස් මිශ්‍රවී පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල සිමෙන්ති වැලි මිශ්‍රනයක් යොදා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඇස්තමේන්තුව අනුව නිවෙසේ ගෙබිමේ කොන්ක්‍රීට් සනකම අඟල් 3 ක් විය යුතු වුවද, කඩා පරීක්ෂා කිරීමට අනුව එහි සනකම අගල් 1.5, 2 හා 2.5 ප්‍රමාණයන්ගෙන් පැවතිණි. | කොන්ත්‍රාත් අධීක්ෂණයට පත්කර ඇති පාර්ශවයන් විසින් නිසි පරිදි අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතු වීම. | ඇස්තමේන්තුවේ අයිතම අංක 3.4 අනුව නිවස තුල ගෙබිම කොන්ක්‍රිටයේ සනකම 3 විය යුතු අතර යම් ස්ථාන වලදි සනකම 3 ට වඩා අඩු හෝ වැඩි විය හැකි අතර එසේ වෙනස් වීමට පොළොව මතුපිට සමාකාර ලෙස මට්ටම් නොවීම හා අතින් පොළොව සැකසීමේදී මතුපිට මට්ටම් කිරීම ක්‍රමවත් නොවීම හේතුවිය.යම් ස්ථානවල සනකම එසේ අඩුවී ඇත්නම් කොන්ත්‍රාත්කරුහට අඩුකර ගෙවීමට කටයුතු කෙරේ |

| | | |
|---|---|---|
| (ii) ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 19 ක් වූ ඕපල්ගල වතුයායේ ඇලගල කොට්ඨාශයේ නිවාස 20 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2018 අප්‍රේල් 27 විගණන දින වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුනේ නිවාස 14 ක පමණි. නිවාස නායයෑමේ අවධානමකට ලක් විය හැකිව තිබූ අතර, අඩක් ඉදිකර අතරමග නවතා තිබුණු කොන්ක්‍රීට් කුළුනුවලින් ඉහලට නිරාවරණය වී ඇති කම්බි මළබැඳි දිරායාමට ලක්වෙමින් පැවතුණි. | ව්‍යාපෘතිට ආදාල භූමිය තෝරා ගෙන **NBRO** වාර්තාව අනුව සුදුසු පරිදි නිවාස සංඛ්‍යාව තෝරා ගැනීමටත්, කොන්ත්‍රාත් නිසි පරිදි අධීක්ෂණය කිරීමටත් කටයුතු කළ යුතු වීම. | නිවාස ව්‍යාපෘතිය සඳහා ඉඩම් තෝරා ගැනීමේදි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයන් සලකා බලනු ලබන අතර පස සංරක්ෂණය කිරීමට අදාළ සංවර්ධන යෝජනා අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. එසේම මළ කෑ කම්බි ශුද්ධ කර කොන්ක්‍රීට් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. |

**3.8 ප්‍රසම්පාදනයන්**

-------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ---------- | ------------------------------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ.4.1 හා 4.2 වගන්ති ප්‍රකාර පූර්ව කොන්ත්‍රාත් අදියර හා පශ්චාත් ප්‍රසම්පාදන අදියර යටතේ සකස් කළ යුතු සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධානද සැලකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කළ යුතු වීම. | 2019 වර්ෂයේ දී විගණන වාර්තාවෙන් පෙන්වාදී ඇති සියලුම ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | **අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන නිවාස යෝජනා ක්‍රමවල කොන්ත්‍රාත් අධීක්‍ෂණයට අමතරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම වැවිලි මානව සංවර්ධන භාරය විසින් ඉටුකිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1(අ) මාර්ගෝපදේශයෙන් බැහැර වීම් නිරීක්‍ෂණය විය. තවද, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් නමින් ගෙවිය යුතු චෙක්පත් පළමුව වැවිලි මානව සංවර්ධන භාරය නමින් නිකුත් කිරීමට ලබාගත්** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (අ) හා දැක්වෙන උපදෙස්වලට අනුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. | 2015/09/21 දිනැති අංක 1933/13 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම මානව වැවිලි සංවර්ධන භාරය, අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් ලෙස ගැසට් කර ඒ අනුව මෙම ප්‍රතිපාදන ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. අදාල වැවිලි සමාගම් විසින් දෙනු ලබන භූමිය තුලට බාහිර පාර්ශවයන් වෙත ඇතුල් වීම සීමා කර ඇති බැවින්, වතු සේවක නිවාස සමුපකාර සමිති හරහා |

| | |
|---|---|
| **අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.** | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. |

**3.9 වත්කම් කළමනාකරණය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**---------------------** | **නිර්දේශය**<br>**----------** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-----------------------------------** |
|---|---|---|
| සෞම්‍ය මූර්ති අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මකව පැවති පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය, හා ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය යන ආයතන හතරේ චංචල හා නිශ්චල දේපළ භාණ්ඩ සමීක්ෂණය කර එම වත්කම් නිසියාකාරව අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 755 (1) හා (2) ප්‍රකාරව වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමට 2019 සැප්තැම්බර් 27 දින දක්වාම කටයුතු කර නොතිබුණි. උක්ත කරුණු හේතුවෙන් 2017 ජූනි 28 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් කොම්ට්‍රෝල් ජනරාල් කාර්යාලය වෙත මෙම ආයතන හතරට අයත් වත්කම් ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් නිසියාකාරව භාරගැනිමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | සෞම්‍ය මූර්ති තොණ්ඩමන් පදනම යටතේ පැවැති පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය හා ප්‍රජාශක්ති මධ්‍යස්ථානය යන හතරෙහි චංචල හා නිශ්චල දේපළ සියල්ල අමාත්‍යාංශය යටතට පැවරීමේ දී භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැති වුවද පවරා ගැනීමෙන් පසුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය 2019 ජූනි මස 15ට පෙර අවසන් කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |

**3.10 බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය**<br>**---------------------** | **නිර්දේශය**<br>**----------** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-----------------------------------** |
|---|---|---|
| අමාත්‍යාංශ ගොඩනැගිල්ලේහි බිම් මහලේ පිහිටි කිරිහල සහිත ගොඩනැගිල්ල අමාත්‍යාංශයේ සුභසාධක සංගමය විසින් ගිවිසුමකට එළඹ බාහිර පාර්ශවයකට බදු දී තිබූ අතර, කිරිහලේ විදුලි හා ජලය සඳහා වූ වියදම හා කුලිය අමාත්‍යාංශය වෙත අයකර ගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ලබා දී ඇති වත්කම් වෙනත් ආයතනවලට පැවරීමේ දී අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට බාධාවක් නොවන වත්කම් පමණක් විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත |

## 3.11 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.109,006 ක හානි පාඩු 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 113(4) ප්‍රකාරව අය කර ගැනීමට හෝ කපාහැරීමට 2018 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි.<br><br>2019 වර්ෂය තුළ මු.රෙ. 113(4) ප්‍රකාරව කටයුතු කරමි. |
| (ආ) | 2016 අගෝස්තු මාසයේ වෙන් කළ වාහනයකට සිදුවූ අනතුරකදී තුන්වන පාර්ශවීය රක්ෂණයක් පමණක් සිදු කර තිබීම හේතුවෙන් එය අළුත්වැඩියා කිරීමට රු.1,032,130 ක් වැයකර තිබුණි. 2018 ඔක්තෝබර් 25 දින ඉදිරිපත් කරන ලද මුදල් රෙගුලාසි 104(4) වාර්තාවෙන් අනතුරට වගකිවයුතු නිලධාරින් දෙදෙනාගෙන් අළුත්වැඩියා වියදම අයකර ගැනීමට නිර්දේශය කර තිබුණත්, 2019 අප්‍රේල් 30 දින වන විටත් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වීම. | 2016 08.22 දිනැති අංක **JY** 2916 දරණ වාහනයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 (4) යටතේ පවත්වන ලද පරීක්ෂණයේ අවසන් වාර්තාවට ඇතුලත් වාහනයට වූ අලාභය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් සහ රියදුරුගෙන් අයකර ගැනීමට නියෝග කර ඇති අතර එම නිලධාරීන් දෙදෙනා සේවයෙන් ඉල්ලා අස්වී ඇත. ඒ අනුව පෞද්ගලික ලිපි ගොනු ආශ්‍රයෙන් ඔවුන්ගේ තොරතුරු ලබාගෙන අදාල මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවති. |
| (ඇ) | **KB-** 9614 රථයට 2017 පෙබරවාරි මාසයේ සිදුවූ අනතුරෙන් රජයට සිදුවූ රු.272,276 ක පාඩුව මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 113(4) ප්‍රකාරව අය කර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතු වීම. | **KB** 9614 දරණ වාහනය අනතුරකට පත්වීම නිසා රජයට සිදුවූ රු.272,276/= ක පාඩුව රථයේ රියදුරු ලෙස කටයුතු කළ සමන් ප්‍රදීප් කුමාර මහතාගේ වැටුපෙන් 2019 මැයි මස සිට අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අභිමථාර්ත වලට අනුව පේලි නිවාස වල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත 2020 වසර අවසන් වන විට , පානීය ජල පහසුකම් ,විදුලිය සහ පිවිසුම් මාර්ග සහිතව තම අයිතියට වෙන්වූ පර්චස් 07 ක භූමියක් සමග නිවාස ඒකක 2,000 ක් හිමිකර දීම ලෙස දක්වා තිබුණි. එසේ වුවද, 2018 වර්ෂය තුල යෝජිත සම්පූර්ණ නිවාස සංඛ්‍යාවම ඉදිකර නොමැති අතර, ඉදිකළ නිවාසද නිසි ප්‍රමිතයට නොමැති වීම හේතුවෙන් එම නිවාස ප්‍රතිලාභීන් භාර ගැනීම හෝ පදිංචි වීමට කටයුතු කර නොතිබුණි. | 2020 වසර අවසන් වන විට තිරසර සංවර්ධන අභිමතාර්ත වලට අනුව යෝජිත ඉලක්ක ලගා කර ගැනීමට හැකි වන ලෙස කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

**5. මහජනයා වෙත සේවා ඉටු කිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහජන පැමිණිලි භාර ගැනීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇති නමුත් එමගින් මහජනයාගෙන් පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කිරීමට හා ලේඛනයකට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මහජන පැමිණිලි ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම. | අමාත්‍යාංශ වෙබ් අඩවිය නිර්මාණය කර ඇතත් එහි තවදුරටත් ප්‍රවර්ධන කාර්යයන් සිදු කිරීමට ඇත. එම අවස්ථාවේදී මෙම කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | නිවාස ව්‍යාපෘති ඉටු කිරීමේදී දරිද්‍රතාවයෙන් පෙලෙන නිවසක හිමිකාරිත්වයක් නොමැති අත්‍යාවශ්‍ය පුද්ගලයන්ට මෙම නිවාස නොලැබෙන බවත්, තෝරා ගැනීමේ නිසි ක්‍රමවේදයක් නොවන බවටත් මහජන නියෝජන ලැබී තිබුණි. | නිවාස ලාභීන් තෝරා ගැනීම් ක්‍රමවේදය නිවැරදිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ නිවාස 411ක් ඉදිකිරීමට අනුමැතිය ඇත. 2018 වර්ෂය සඳහාද විශේෂයෙන්ම නාය යාමට ලක් වූ හා නාය යෑමේ අවදානම් සහිත ප්‍රදේශ වල ජීවත් වන ජනතාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලැබුණු නිවාස ඉල්ලීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට තීරණය කර ඇත. 2018 දෙසැම්බර් 31 ප්‍රගතිය අනුව ඉහත 411 න් නිවාස 85ක් පමණක් සම්පූර්ණයෙන් නිම කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නාය යෑමෙන් අවතැන් වූ පුද්ගලයන් වෙනුවෙන් අයිලා වත්ත කොටසේ නිවාස 47 ක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ රු.47,000,000 ක් අනුමත වී තිබුණි. එම නිවාස ඉදිකිරීම සඳහා 2018 පෙබරවාරි 12 දින වැවිලි මානව සංවර්ධන භාරය විසින් අයිලාවත්ත වතු සේවක සමූපකාර සමිතිය සමඟ එක් නිවසකට රු.950,000 බැගින් වූ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව එම නිවාස ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 12 දින වන විට නිම කළ යුතු වුවත්, විගණන දිනය වූ 2019 අප්‍රේල් 26 දින වන විට සිදු කර තිබුණේ නිවාස ඉදිකිරීම සඳහා බිම සකස් කිරීම පමණි. | මහජනයා වෙත සේවා ඉටු කිරීමේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතු කාර්යයන්ට මූලිකත්වය දී නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කිරීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. රජයේ මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීමට සැලසුම් සකස් කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල 341 ක්වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 223 ක් වීම හේතුවෙන් 118 ක පුරප්පාඩු පැවතිණි. | අමාත්‍යාංශයේ කාර්යසාධනයට තනතුරු පුරප්පාඩු විශේෂයෙන් බලපාන බැවින් ඒවා සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කළ යුතු වීම. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |